සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 71 | S | I |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 12 - 2018**

විභාග අංකය .............................

සිංහල I

කාලය පැය තුනයි

❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) බමුණාණෝ ඒ අසා සුඹුළු ආදිය ගෙන ගොස් කකාරා පෙරා දෙති. පය බරවායට පිටිකර බෙහෙත් බඳිනා සේ ඇස් සරහන්ට තොළ අඳුන් ගානා සේ වරදවා කරන පිළියම් හෙයිනුත් අවස්ථා දැන නිදන් බලා කරන පිළියමක් නොවන හෙයිනුත් බෙහෙත් කෙරෙමින් සිටියදී ඒ ඒ විෂයට ප්‍රතිනියත මන්ත්‍රාදිය තිබියදී අනික් මන්ත්‍රාදියකින් විෂ බාමින් සිටියදී වඩාගෙන යන විෂයක් මෙන් රෝගය බලවත් ව ගොසින් මරණින් මුත් පිළියමින් ආසාධ්‍යබවට පැමිණියේය. එකල බමුණාණෝ ආඳ යවා තබාලා වල්පත ගන්නා සේ වෙදවරුන් ගෙන්වන අවස්ථාවේ රෝගහානියටත් වඩා වස්තුහානිය නොකැමති ව නොගෙන්වා අතෙකිච්ඡ අවස්ථාවෙහි වෙදාණකෙනෙකුන් ගෙන්වූය.

(i) කකාරා පෙරා දීම සඳහා බමුණා යොදා ගත්තේ මොනවා ද?

(ii) රෝගය බලවත්වීමට හේතු වූයේ කුමක් ද?

(iii) බමුණා වෙදාණ කෙනෙකුන් ගෙන්වූයේ කුමන අවස්ථාවේ දී ද?

(iv) 'ප්‍රතිනියත' හා 'වල්පත' යන වචනවල තේරුම් ලියන්න. (ලකුණු 4යි)

(ආ) තවද, වන පොළඹමින් පිටින් පිට තොළු තබා තන්හි තන්හි ලන පලළුවත් ඇද කමින් ඇවිදිනා ලද නොයෙක් ජාතියෙහි ජලජර පක්ෂීන් කෙළිනා ලදුව පස්පියුමෙන් කලල් විල් තටාක පංක්තියෙන්ද ආමූලාග්‍රව පිපී වැනී ගියාවූ හඳුන් සඳුන් දෙව්දුරු තුවරලා ආදී වූ නොයෙක් සුවඳ රුකින් ගැවීසී ගත් නොයෙක් සිය දහස් ගණන් වනසට පංක්තියෙන්ද විරාජමනාවූ ඉතා දර්ශණීය වූ පෘථිවිය නැමති අංගනාව විසින් පලඳනා ලද මිණිකිරුළු අගක් මෙන් උස්ව ඉතා සෝබමානා වූ මෙහි මච්චනය පෙර හා සමග කෙළ ඇවිදිනා බව වැටහෙන බව මුත් ඉනිබ්බ තාගේ විරක සෝක දුක්ඛයෙන් හඬනා ලද්දා වූ මට අඳුරු ගෙයක් මෙන් නිස්සෝභාව වැටහෙන්නේය.

(i) 'පස්පියුමෙන්' යන්නෙහි ව්‍යාකරණ ලක්ෂණ දක්වන්න.

(ii) මෙහි සඳහන් සුවඳ රුක් නම් කරන්න.

(iii) මෙහි තා, මට, යන්නෙන් සඳහන් වන්නේ කවුරුන් ද?

(iv) පෘථිවිය නැමැති අංගනාව විසින් පලඳනා ලද මිණි කිරුළු අගක් මෙන්' මෙහි උපමාව හා උපමේය පැහැදිලි කරන්න.

(v) 'පලළුවත්', 'මච්චනය' යන වචනවලට අර්ථ සපයන්න. (ලකුණු 4යි)

(ඉ) 'ඇසුව මැනව දේවයන් වහන්ස, මේ උත්තර මධුරා නම් නුවර ස්වර්ණතිලකා නම් වූ එක් සැඩොල් දුවක් ඇත. ඕතොමෝ තමා හා සමාන ජාති ඇති පුරුෂයන් විසින් එවන ලද පඬුරු නොගන්නීය. වංශවතුන් ම ප්‍රාර්ථනා කෙරෙයි. කිමෙක් ද දේවයන් වහන්ස, පක්ෂීන්ගෙන් හීන වූ කපුටුධෙනුවක් තොමෝ කවර කලෙක ස්වර්ණහංසරාජයකු හා සමඟ කෙසේ නම් සමාගම වේ දැයි කීය. එතෙපුල් අසා රජ්ජුරුවෝ ස්වර්ණතිලකාවගේ පියාණන් කැඳවා එම්බල සගය, තාගේ දුවක් කුලවනකය මිස සමාන ජාති ඇති පුරුෂයන් නොකැමැත්තී ල කිමෙක් ද ඒ සබා දැ'' යි විචාළහ.

(i) මෙහි සඳහන් සැඩොල් දුව කවුරුන් ද?

(ii) ඇය පඬුරු නොගන්නේ කාගෙන් ද?

(iii) දෙදෙනෙකුගේ නොගැලීම මෙහි දක්වා ඇත්තේ කෙසේ ද?

(iv) හීන, හා කුලවනතයන් යන වචනවල තේරුම් ලියන්න. (ලකුණු 4යි)

(ඊ) පසුකර රුසිරෙන් සුරඹා
ගොසකර රන්මිණ සලඹා
එනුවර කෙළි රඟ පුරඹා
බඹසර සිත වත් කළඹා

පැහැර රඟන සුරන් රඟා
එපුර සියලු දන සරඟා
නිතර කෙළිති සිත සෙ රඟා
කවර කලෙක වෙද එරඟා

(i) සෝෂා කරන්නේ කුමක් ද?

(ii) මෙහි දැක්වෙන ආකාරයට කලඹන්නේ කාගේ සිත ද?

(iii) 'පැහැර රඟන සුරන් රඟා' යන්නෙන් ප්‍රකාශිත අදහස කුමක් ද?

(iv) 'සුරඹා' 'පුරඹා' යන වචනවල තේරුම් ලියන්න. (ලකුණු 4යි)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) ''යහළු තෙපි මහණ වුවාහු නම් මමත් රාජ්‍ය ශ්‍රී හැර තොප හා සමඟ මහණ වෙමි''

(ii) ''වැලිත් මේ ශෝක දුක්ඛය උදක් මාගේ ජීවිත අපේක්ෂාවේම නොවෙයි''

(iii) ''එම්බා මේ ලෝකවාසී සත්වතෙම අනඝී මුතුමැණික් ආදී වූ රත්නජාතයන් අමෙධ්‍යයෙහි හුනක් අපවිත්‍ර යයි නින්දාකොට නොහරන්නේ මය''

(iv) '' වෙන්න බෑ මොකක් ගැනද? වෙන කෙනෙක් වෙන්න ඇති''

(v) '' උඹලෑ අප්පොච්චි ඒ මන්තරේ උඹටත් දුන්නද?''

(vi) '' ගෙට පැමිණෙන අමුත්තන්ට - මෙසේ ද ඔබ සලකන්නේ? (ලකුණු 8 යි)

(ඌ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

හිරුරැස් විඩාවෙන් පීඩිත කෙසෙල් වතු
සනසා පවන නළවයි දළු රිකිලි අතු
මළහිරු කිරණ සිප ගැවුණ පරිදි ලතු
රන්වන් වුනා පළුගස්වල මහලු පොතු

මැඩියෝ අඬති පෙරළු නව කුඹුරු මඩින්
බස්සෝ ඉගිල යති නිහඬව හිසට උඩින්
වවුලෝ පියාඹති මී ගෙඩි රැගෙන තුඩින්
ඈ කිසිවිටෙක තැති ගත්ත ද මෙවැනි හඬින්

සෙවණැලි නිදාගති ගම වටකළ බැද්දේ
උණ බට තරඟයට මෙන් එකටෙක මැද්දේ
උකුළෙහි කළය ඉඟ අග තාලෙට පැද්දේ
ඇය එනු බලා වැඩිවෙයි රළවැල සද්දේ

මඟ අස මලාවැලි යුතු තැනිතලා වල
තණගොබ සමඟ පොරකයි නවතලා පැල
කේතකී පඳුරු අතරින් නැඟ සලා ගෙළ
ඇය දෙස බලයි නිහඬව සුදු බලා වැළ

හැන්දෑ වලාකුළු නිල් නුබ ඔතා ගතී
වෑ බඩ උණ පඳුර ඇය ගැන කතා ඇතී
රන්සර කැකුළු පෙඳ රැළි මැද ගොතා වෙතී
පොබයයි ඇගේවත නැරඹුම පනා පෙතී

දෙසවන අදී වැව් පිටියේ නඳ සීරු
පෙළ රැළි පෙනේ ලෙස නිල් වරලස පීරූ
දේදුණු පෑ දියේ තව පීනති සේරූ
පෑපත් රළ වළලු ඉන් වෙයි හුව මාරු

මංකඩ දිලේ විසිතුරු හිරු කිරණ වැනී
ඈ ඒ එළිය බී මගෙ හදවතට අනී
දියවැල් ඇගේ පය දැවටී වැළ ද ගනී
රන්වන් රිදී පෙති වතුරෙන් උඩට පනී

රැබෝවීම මගෙ සතුටට හරස් වුණා
ඈ මා දැකීමෙන් මදකට තිගැස් සුණා
අවිහිංසකව ඒ සමඟම හිනැස් සුණා
සතරැස පුදුම විදියට එක ඇසක් වුණා (ලකුණු 16යි)

02. අවසරෝචිත පරිදි භාෂාව හැසිරවීම සද්ධර්මරත්නාවලී කතුවරයාගේ කතාකලාවේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයකි.'' මට්ටකුණ්ඩලී කථාවස්තුව ඇසුරෙන් විමසන්න. (ලකුණු 15යි)

නැතහොත්

පාඨක, ශ්‍රාවක සිත්සතන්හි කරුණ රසය ජනනය කරවන ඉතා සංවේදී කතාවක් ලෙස චන්දකින්නර ජාතකය අගය කළ හැකිය. උදාහරණ සහිතව විමසන්න.

03. ස්ත්‍රියකගේ රූපසුව හමුවේ මිනිසුන් අන්ධව අගාධයට පත්වන අයුරු සද්ධර්මාලංකාරයේ ස්වර්ණතිලකා වස්තුවෙන් හෙළිවේ විමසන්න. (ලකුණු 15 යි)

04. බැද්දේගම නවකථාවේ එන පුංචිමැණිකා එඩිතර මෙන් ම සංවේදී හදවතක් ඇති චරිතයකි'' උදාහරණ සහිතව විමසන්න. (ලකුණු 15යි)

05. උදේනි පුර සැණකෙළිය විචිත්‍රවත් අයුරෙන් වර්ණනා කර ඇති ආකාරය උදාහරණ සහිතව විමසන්න. (ලකුණු 15යි)

06. ළමුන්ට ළමා ලෝකයේ සුන්දරත්වය විඳීමට පන්තිභේදය බාධාවක් නොවන බව 'අකුරට යන වෙලාවේ' කෙටි කතාව හෙළිදරවු කරයි. සාකච්ඡා කරන්න. (ලකුණු 15යි)

07. නූතන කවීන් තම අරමුණ ඉටුකර ගැනීම සඳහා පරිසරය සජීවීව යොදාගෙන ඇති ආකාරය නූතන පද්‍ය සංග්‍රහයේ ඇතුළත් පද්‍ය පංති තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

08. 'උද්දාල බමුණු ඇඳුරිඳු උගත් පඬිවරයෙක් වුව ද, එදිනෙදා ප්‍රායෝගික ජීවිතයට අවශ්‍ය අත්දැකීම් කුසලතා හීන වූවෙකි'' පෙමතො ජායතී සොකො නාට්‍ය පෙළ ඇසුරෙන් විමසන්න. (ලකුණු 15යි)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

71 | S | II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 12 - 2018**

විභාග අංකය .............................

# සිංහල II

කාලය පැය තුනයි

- I කොටසේ 1 ප්‍රශ්නය ද II කොටසේ **2,3,** ප්‍රශ්න ද, ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- I ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මෙම **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- I කොටස II කොටසේ පිළිතුරුපත් සමග **අමුණා භාර දෙන්න.**

## I කොටස

1.1 **සන්ධ්‍යක්ෂර** පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1. ඊ, ඔ,ආ, ඌ
2. ඉ, ඊ, ඕ, අ
3. එ, ඓ, ඔ, ඖ
4. අ, ඈ, ඓ, ඕ
5. ඊ, උ, එ, ඔ (................)

1.2 පද හතරෙහි ම **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත වරණය තෝරන්න.

1. වීරෝධාර, පරමාර්ථ, ශිෂ්ඨාචාරය, දිෂ්ඨි
2. ස්පුට, පුස්ථකාළය, ආභාෂය, වෛශාඛා
3. ලේඛණ, කොට්ඨාශ, විශ්මය, සංවර්ධනය
4. පෘථිවිය, සන්දිග්ධ, ජෛෂ්ට, ප්‍රාමානික
5. ශ්‍රේෂ්ඨ, ප්‍රදර්ශනය, ව්‍යාපෘති, අතෘප්ත (................)

1.3 **අකාරාදී පිළිවෙල අනුව** නිවැරදි පද පේළිය තෝරන්න.

1. ගම්පෙරළිය, නොමියෙමි, පියසමර, බැද්දේගම, හඳපාන
2. නිධානය, ලෙන්චිනා, කැඩපත, සුරක්ෂා, හිමිඅහිමි
3. රාමායනය, සිංහබාහු, මනමේ, වසන්තය, කදාවළලු
4. පළිගැනීම, මළගිය ඇත්තෝ, ලෝභයා, වසුන්දරා, වවුලුව
5. හුළං බෝලය, ජය සුමන, ගෝඨාභය, වාල්මිකී, ඖෂධීය (................)

1.4 **උක්ත හා අනුක්ත පද දෙක** බැගින් ඇති වරණය තෝරන්න.

1. නිළියක, හතුරෙකු, සැමියෙක්, සිඟන්නෙකු
2. හිමිවරු, සේවකයන්, ඕ, පියාණෝ
3. මයිනා, ගිරවා, සැවුලා, කාක්කා
4. ගැමියන්, අසල්වැසියෝ, විදේශීහු, තා
5. නරියන්, මුවන්, සාහසිකයෝ, දැරියක (................)

1.5 පහත ප්‍රකාශ අතුරින් **නිවැරදි ප්‍රකාශය** තෝරන්න.

1. ප්‍රශ්නවාචී ද නිපාතය යෙදෙන විට ආඛ්‍යාතය වෙනස් වේ.
2. කෘදන්ත පදය අනාගත ක්‍රියාව ලෙස සලකන අවස්ථා ද ඇත.
3. නිශ්පන්න ධාතු යනු වෙනත් රටවල් හා මිත්‍ර වී සැදුන නාම වේ.
4. ශ්‍රැති සූචනාර්ථයෙහි දී ල, ලූ නිපාත නොයෙදේ.
5. ඕ, හූ ප්‍රත්‍ය ගැන්වූ අප්‍රාණවාචී නාම උක්ත වූ වාක්‍යවල ආඛ්‍යාත ඒක වාචීව ම යෙදේ. (................)

1.6 **රේඵය, රකාරාංශය, ගයනුකිත්ත, විසර්ගය** සහිත වචන අනුපිළිවෙළින් යෙදුණු පද පේළිය තෝරන්න.

1. වක්‍රය, තර්කය, බෞද්ධයා, මනඃකල්පිත
2. චර්මය, ප්‍රාදේශීය, මහෞෂධ, අන්තඃපුරය
3. නිබ්බාණ, ගෞරවය, සංග්‍රහය, සන්තුට්ඨි,
4. කෞශල්‍යය, ධ්වනිය, භෘංග, අන්තඃපුරය
5. වර්ධනය, වක්‍රාකාර, ගෞතම, සංඝ (.................)

1.7 එකිනෙකට **අනුරූපව වචන යුගල** නොයෙදුණ වරණය තෝරන්න.

1. පැන්පෙට්ටිය, අහස්යාත්‍රාව, බත්මුල, කරත්තරෝදය
2. කොඩිකණුව, ක්ෂිරසාගරය, සමුද්‍රරාජයා, නේත්‍රප්‍රසාදය
3. ඍතුභේදය, මාතෘප්‍රේමය, වෛඩූර්යමාණික්‍යය, මණ්ඩපජායාව
4. කේසරනාදය, පත්මසුගන්ධය, ග්‍රන්ථප්‍රකාශන, සත්වසංහතිය
5. බිඟුනද, ජලතටාකය, බෝධිසරය, භූමිකම්පාව (.................)

1.8 **තත්සම පද අන්තර්ගත නොවන** පද පේළිය තෝරන්න.

1. බලි, ලොරි, නරි, මුනි, ගිරි
2. මුරය, නාඩගම, නංගී, යක්ෂ, නාමක
3. වසයි, බලයි, තෝරයි, මැරෙයි, පුදුමය
4. ගම්පහ, මාතර, කොළඹ, කළුතර, කතරගම
5. ග්‍රන්ථ, පූර්ණ, රූක්ෂ, අස්ථි, මරණ (.................)

1.9 මුලින් දැක්වෙන පදයට **විරුද්ධාර්ථයක් නොදෙන** පදයක් සහිත පද පේළිය තෝරන්න.

1. විපත - ජනිත වීම, ඉපදුම, හටගැනීම, බිහිවීම
2. මේරූ- මොළොක්, මටසිලිටි, කෝමල, නොපැසුණු
3. කඩිසර - අලස, කුසීත, උකටලී, ඔතැනි
4. ප්‍රභවය - කෙළවර, කොන, අවසානය, අනන්තය
5. ආලෝකය - තිමිර, කළුවර, ඇඳිරිය, ඔභාස (.................)

1.10 **කෘදන්ත පදයක් අන්තර්ගත නොවන** පද පේළිය තෝරන්න.

1. කැපිලි, නැටිලි, ලියවිලි, කැවිලි, සේදිලි
2. දුවන, පනින, නටන, ලියන, දුවන
3. තැවුම්, නැවුම්, ලියුම්, පියුම්, රැවුම්
4. කෑම, බීම, නැටීම, රැකීම, ඉසීම
5. පිරුණු, කැඩුණු, වැටුණු, බිඳුණු, ඉසිරුණු (.................)

1.11 මුලින් දැක්වෙන පදයට **සමානාර්ථයක් පදයක් ඇතුළත් නොවන** පද පේළිය තෝරන්න.

1. බුද්ධ - දසබල, තිලෝනා, සුගත්, මුනි
2. සිරිකත - කමල්, ශ්‍රීකාන්තා, ලක්ෂ්මී, සිරිදුව
3. දසන් - දත්, දන්ත, දාඨා, රදන
4. වෑයම - උත්සාහය, පරිශ්‍රමය, යත්නය, වීර්ය
5. උගත් - වියත්, පණ්ඩිත, විදග්ධ, නූගත් (.................)

1.12 **අව්‍ය, දකාරාර්ථ, විශේෂණ, විභක්ති** යන සමාසවලට අයත් පද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

1. එළුමස්, කුකවි, බඹසුරනර, වනමල්
2. අලිමිනිහා, අත්කම්, සියපත්, ගල්හිත
3. සුචරිත, පොත්පත්, උණුවතුර, සොරබිය
4. පොල්තෙල්, නොබියව, අකුසල්, පන්සිල්
5. නිල්මහනෙල්, කළුකොඩි, මිහිඳුම්, බෙහෙත්බඩු (.................)

1.13 පහත සඳහන් වැකිවල ඇතුළත් **ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.

1. බිත්ති සැරසිල්ලක් **<u>තනන්නට</u>** මම සිතීමි.
2. කම්කරුවා සේවයේ යෙදුනේ පැසසුම් **<u>ලබමිනි.</u>**
3. මුදල් **<u>ලැබුණොත්</u>** තාත්තා ගෙදර එයි.
4. ගුරුවරයා සිසුවා ලවා ගේට්ටුව **<u>වසවයි.</u>**

1. අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා
2. අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා
3. ප්‍රයොජ්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
4. මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා, ප්‍රයොජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
5. මිශ්‍ර ක්‍රියා, ප්‍රයොජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා (................)

1.14 **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

1. සුගන්ධ, සංවාද, පරිභෝග, ප්‍රවර්ධන
2. උපදේශ, අඹමල්, අතිරික්තය, නිකේතනය
3. සංග්‍රහය, උපද්‍රව, සුධීර, අවප්‍රමාණ
4. සතුටු, විප්‍රයෝග, අත්‍යුත්තම, අනුකරණ
5. අපහරණ, අදිරද, පිරියම්, අලස (................)

1.15 ‘ දිගු නෙත් **<u>නිලුපුලෙව්</u>** **<u>රතදර</u>** **<u>පබල</u>** රඟ’ යන්නෙහි තද කළු අකුරින් දැක්වෙන පද පිළිවෙළින් අයත් වන්නේ මින් කුමන ව්‍යාකරණ වර්ගයට ද?

1. සන්ධි, සමාස හා නිපාතවලට ය.
2. සමාස, සන්ධි හා නිපාතවලට ය.
3. සන්ධි, සමාස හා කෘදන්තවලට ය.
4. සන්ධි, සමාස හා උපසර්ගවලට ය.
5. සමාස, සන්ධි හා තද්ධිතවලට ය. (................)

1.16 ව්‍යාකරණානුකුලව **නොගැළපෙන පදයක් ඇතුළත්** වරණය කුමක් ද?

1. සලපතල, ප්‍රසිද්ධ, කුදිටු, අවනත
2. ලට්ටලොට්ට, ඉවක්බවක්, ආතබූත, ඉහනිකට
3. සඳතරුමල්, කිරිබත්, සුගායනීය, තිනෙත්
4. පොකුර, සමූහය, කැළ, කැන
5. රජතමය, බුද්ධිමත්, ධනවත්, සිගිති (................)

1.17 **සමාස පදයක් ඇතුළත් නො වන** වරණය තොරන්න.

1. දීබත්, කිරිබත්, අනලස්, අත්කම්
2. සරාසඳ, රජපිරිස්, සුරබොජුන්, මරබිය
3. නවදොර, දසරජදම්, තෙරුවණ, අටසිල්
4. දසබල, සඳවත, දූන්වත්, දූම්දුරු
5. ගවපල්, පරපුටු, තණපා, මුහුලස් (................)

1.18 **එක ම වර්ගයට අයත් සන්ධි පද** ඇතුළත් වරණය තෝරන්න.

1. බිලියම්, පිළියම්, සුණුවම්, ගෙත්තම්
2. වල්ලැතා, වටොර, මැත, දැගසවු
3. පසැස්, මතැත්, නෙතින්, මහෙසුරු
4. රියැදුරු, පිළිතුරු, බුදුකුරු, අනුරුත්
5. මියුගුණ, නොයෙක්, දුවඟ, රුවාරු (................)

1.19 ව්‍යාකරණානුකුලව **නිවැරදි වාක්‍ය** තෝරන්න.

1. නදී තොමෝ සෙමෙන් ගලා බසිති.
2. අස්හු සිවු දෙනෙක් රිය ඇදගෙන ගියහ.
3. සොරු ගෙවල් බිඳියි.
4. යමෙක් ඒ විලට බසී ද යළි තොටට නොඑයි.
5. තුරු පෙළ සුළඟට සෙලවෙති. (................)

1. 20 වඩාත් ම නිවැරදි පද බෙදීම සහිත වාක්‍ය තෝරන්න.

1. මංකොල්ලය හා සම්බන්ධ සියලුම අය නුදුරේදීම හෙළිවේවි.
2. අපේපාසලේ දක්ෂ සිසුසිසුවියෝ සිටිති.
3. එම සැකය තහවුරු වූ නමුත් සොරුන් සිරගත නොවිණි.
4. මම ගුරුවරයෙක්මිස කම්කරුවෙක් නොවෙමි.
5. අපි අවාසනාවේම ගොදුරු වීසිටිමු ද? (................)

( ලකුණු 20 )

02. අ) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිංහල පද්‍ය කාව්‍ය දෙස බලන්නෙකුට පළමු වරට මුණ ගැසෙන්නේ මනා පුහුණුවක් හඟවන කවි කලාවකි. පද්‍යය අදහස් පළ කිරීමේ මඟක් වශයෙන් සිංහලයා ක්‍රිස්තු වර්ෂයට පෙර දෙ වන තුන් වන ශත වර්ෂවල පටන් යොදා ගත්තේ වී නමුත් රසිකයන්ගේ මන දොළ පිරවීමෙහි සමත් කාව්‍ය රචනා මුලින් ම නිපදවන ලද්දේ ක්‍රි. ව. 8-10 වැනි ශත වර්ෂ අතර කාලයේ දී ය. ඒ කාලයට අයත් සිංහල ගී හා ඇතැම් විට සතර පද පැබැඳුම් හත් සියයකට වැඩි ගණනක් අප'තට පත් වී ඇත. සීගිරියේ කැටපත් පවුරෙහි කුරුටු-ගා ඇති මෙම ගී නොඑක් තරාතිරමේ අය විසින් ලියන ලදී. සීගිරි පද්‍ය නමින් සාහිත්‍යයේ හැඳින්වෙන්නේ ඒ රචනා සමූහය යි. කවුරුන් විසින් කවර කලක ඒවා කරන ලද ද එයින් පිළිබිඹු වන කවීත්වය උසස් බව විචාරකයන්ගේ පිළිගැනීමය යි. ඒ කවීත්වය උසස් යැ යි පිළිගැනීමට හේතු කවරේ ද? සීගිරියට පැමිණි කාගේ වුව ද සිත්ගන්නා විසිතුරු රූප අද ද දක්නට ලැබේ. අට වැනි නව වැනි දස වැනි ශත වර්ෂවල එහි ගිය ජනයාගේ නෙත් සිත් ඇද ගැනීමේ ශක්තියෙන් අදට වඩා එ දා රූපවල තිබුණු බව නොඅනුමාන ය. එහි ගිය ජනයාගේ සිත් එ රූ නැරැඹීමෙන් කුල්මත් විය. කුල්මත් වූ ඔවුන්ගේ සිත් සතන් හි නන් විදියේ හැඟීම් ජනිත විය. ඔවුන්ගේ සිත් තුළ පහළ වූ ඒ හැඟීම් කෙතරම් ගැඹුරු වුව ද කොතරම් සියුම් වුව ද එය පළ කිරීමට ඔවුනට තිබුණේ සීමිත ඉඩ ප්‍රමාණයකි. තමන්ගේ සිතුවිලි හා හැඟීම් එක් ගීයකින් හෝ දෙකකින් හෝ පැවැසීමට ඔවුනට සිදු විය. දිග කවක් බැඳීමට හෝ මහඟු ග්‍රන්ථයක් නිපදවීමට හෝ ඒ අයට ඒ මහ ගලින් අවසරයක් නොලැබුණේ ය.

1. මෙහි එන ලෙසට සිංහල පද්‍ය ආරම්භ වී ඇත්තේ කවර කාලයේ දී ද?
2. සීගිරි ගී ලියා ඇත්තේ කවුරුන් ද?
3. සීගිරියට පැමිණි අයවලුන්ගේ සිත් ඇද ගත්තේ කවුරුන් ද?
4. සීගිරි ගී ලියූ අය එක් කවියකින් හෝ දෙකකින් නතර වූයේ ඇයි?
5. මෙම ඡේදයේ අරමුණ කුමක් ද? ( ලකුණු 10 )

ආ) පහත දී ඇති ඡේදය 1/3 වන සේ සාරාංශ කර ලියන්න.

යුරෝපීය ජාතීන් මෙරටට පැමිණීමට පෙර සිට ම වාණිජමය කෘෂි ද්‍රව්‍යයන් මෙරටින් විදේශ කරා ඇදී ගිය ද, ගොවීන්ගෙන් මිළ දී ගත්ත ද, ප්‍රධාන කෘෂි අපනයන ද්‍රව්‍යය වූ කුරුඳු සෑම විට ම රජුගේ ඒකාධිකාරයක් විය. පෘතුගීසීන් කුරුඳු සඳහා අවුරුදු සියයකට අධික කාලයක් වෙරළබඩ ප්‍රදේශ විනාශ කරගෙන ගිය අතර ලන්දේසීහු වෙළෙඳ ජාතියක් වශයෙන් යුද්ධයෙන් සිදුවන අලාභය හොඳින් අවබෝධ කරගෙන සිටි හෙයින් සෑම විට ම සාමකාමී ක්‍රියාමාර්ග යොදා ගනිමින් උඩරට ප්‍රදේශවලින් කුරුඳු ලබා ගැනීමට උත්සාහ කළේ ය. ඉතාමත් අවමන් සහිත කොන්දේසිවලට යටත් කරමින් වුව ද උඩරට රජුගෙන් කුරුඳු ලබා ගැනීමේ ප්‍රතිපත්තියක් ලන්දේසීන් ගෙන ගියේ මේ නිසා ය.

එහෙත් උඩරට රාජධානියේ උරුමය මළබාර් වෙතින් පැමිණි නායක්කාර් පෙළපතට හිමි වීමත් සමඟ මෙම තත්වය වෙනස් විය. ලන්දේසීන් මෙරටින් ගෙන ගිය කරුඳු හා කුළුබඩුවලින් යුරෝපයේ පමණක් නොව පෙරදිග රටවල ද කළ විශාල ලාභය හොඳින් දන සිටි මලබාර් රජවරු එය තමන්ට නතු කර ගැනීමට උත්සාහ දැරූහ. එම නිසා ප්‍රථම වරට වාණිජ වැවිලි කර්මාන්ත ආරම්භ කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට ලන්දේසීන්ට සිදු විය. මුලින් ම කුරුඳු ද පසුව කෝපි හා ගම්මිරිස් ද මේ අයුරින් වාණිජ වැවිල්ලක් ලෙස ලන්දේසීහු ආරම්භ කළහ.

( ලකුණු 15 )

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300 - 350ත් අතර වන සේ ව්‍යාකරණානුකූල විශ්ලේෂණාත්මක රචනාවක් ලියන්න.

i සිංහල අවුරුද්දේ අලෙවිවන අපේ සංස්කෘතිය.
ii නිදහස් අධ්‍යාපනයට ජාත්‍යන්තර පාසල්වල බලපෑම.
iii කැළි කසළින් තොර නිල්ල පිරුණු ශ්‍රීලංකාවක් ගොඩනගමු.
iv වන රජදහන රටකට සම්පතකි.
v සමබර පෞරුෂයක් උදෙසා ක්‍රීඩාවේ බලපෑම.
vi ජන ජීවිත නගා සිටුවන ගෙවතු වගාව.

( ලකුණු 25 )

04. (අ) පහත වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට නැවත ලියන්න.

1. කිසිවක මෙසේ කීවා ය.
2. කාන්තා තොමෝ මිහිරි ගී ගයත්.
3. සමන් මල් සුවඳ ය.
4. ඉඩම් හිමියෝ සේවකයෝ ලවා බිම් සකසවති.
5. ඔවුහු හෝ අපි හෝ නගරයට යති. ( ලකුණු 05 )

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

1. කුරුලු මව දරුවන් රැක්කා ය.
2. වැඩිමහල් සොහොයුරා අසරණත්වයට පත් ඇය රකියි.
3. ශේ වැඩ කරයි.
4. ජයරත්න නයා ද මුගටියා ද මරයි.
5. වසන්ත මල් කඩයි. ( ලකුණු 05 )

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීමට සුදුසු පදය වරහන් තුළින් තෝරන්න.

1. (මිනිස්සු/මිනිසුන් ) සේවා ස්ථානයට යත්.
2. සභා (තොමෝ/තුමූ ) සතුටින් විසිර ගියහ.
3. මැණියන් දෑ (දරුවන්/දරුවෝ) යහමග යැවූහ.
4. (ඕ/ඇය) මහන්සි වී වැඩ කර ජීවිතය ජය ගත්තා ය.
5. වරදට හසු නොවීමට (ඔවුන්/ඔවුහු) කීවේ අසත්‍ය ය. ( ලකුණු 05 )

05. (අ) පහත වාක්‍යවල **තද කළු අකුරින්** දක්වා ඇති පදවල **අර්ථය විග්‍රහ කර** ලියන්න.

1. බෞද්ධයෝ බුදුන්ගේ **චිරස්ථායි** දහමට අනුගත වීම යෙහෙකි.
2. චන්ද්‍රිකා තමන්ගේ සුදුවන් **කියඹුවැල** දෙස බලා සුසුම් හෙළන්නී ය.
3. වර්ග වාදය **මූලෝත්පාටනය** කළ යුත්තකි. ( ලකුණු 03 )

(ආ) පහත යෙදුම්වලට සුදුසු තනි පද ලියන්න.

1. රටක් යටත් කර ගැනීම
2. උසට සුදුසු මහත
3. යුද්ධය සඳහා අඳින ලෝහමය හැට්ටය ( ලකුණු 03 )

(ඉ) පහත වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන තුළින් තෝරා ලියන්න.

1. ඔහු සිසුන් .................. ප්‍රසිද්ධියක් උසුලන්නෙකි.
2. වැසි කල්හි තුරුලතා .................. බර වෙයි.
3. බ්‍රහස්පතින්දා ..................ඉතා සරු ය.
4. ක්‍රීඩාව සැමට ..................සුවයක් ලබා දීමට ද හේතු ය.
5. ඒ ගීතය සැමට .................. ලිහිල් බව ඇති කිරීමට සමත් ය.
6. ඕසෝන් ..................පොදු සම්පතකි.

(පල, ශාරීරික,අතරෙහි,මානසික, වියන, පොළ) ( ලකුණු 03 )

(ඊ) තද කළු අකුරින් ඇක්වෙන බහු අර්ථ පද යොදා වෙනත් අරුත් දෙන වාක්‍ය බැගින් සාදන්න.

1. **අමා** දහර ගලා බසියි.
2. දරුවන් ක්‍රිඩා කරන **කල** දෙමාපියෝ බලා උන්හ.
3. ඔබ සැවොම විභාගය හොඳින් සමත්වීමට **වෙර** දරන්න.
4. මේ **සා** මහත් දුකක් කිසිවෙකුට නොවේවා.
5. සව් **සත** වෙත සෙත සැදේවා.
6. ඇතා මරා දළ ගලවා තිබෙනුයේ **සඳ** එළියේ ය. ( ලකුණු 06 )

06. **තද කළු අකුරින් දක්වා ඇති** පදවල ව්‍යාකරණ වර්ගය දක්වා ඇත. ඒවා අයත්වන අනු අංගය දක්වන්න.

1. **ගුරුතුමා ( සන්ධි )** හමුවීම **සඳහා ( නිපාත )** දරුවන් පෙළගැසී **උන්හ.( ක්‍රියා )**
2. මව දරුවා **අවදිකර ( ක්‍රියා )** සිනාසෙමින් **ගුණවත් ( තද්ධිත )** දරුවෙක් **වෙත්වායි ( ක්‍රියා )** සිතුවා ය.
3. **භක්තිමත් ( තද්ධිත ) ගැමියා ( සන්ධි ) විවාදයට ( උපසර්ග )**සහභාගී නොවීය.
4. **සැදැහැතියෝ ( විභක්ති )** උදෙන් **නැගිට ( කියා ) තෙල්මල්පහන් ( සමාස )**ගෙන බුදුන් පුදත්වා.
5. මඟ තොට **යනෙන ( සන්ධි)** දන **දෙව්දුන් ( විභක්ති ) රැකදේවා. ( ක්‍රියා )** ( ලකුණු 15 )

07. (අ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

1. ඍජුව කළ නොහැකි දේ වෙනත් අයුරකින් කිරීම.
2. පොරොන්දු වූ පරිදි වැඩ නොවීම.
3. තමාගේ දේ විනාශ කොට අනුන්ගෙන් උදවු ඉල්ලීම
4. නුසුදුසු පිළියම් යෙදීම
5. සමාන සිතුවිලි ඇති දෙදෙනෙක් එක්වීම
6. බොහෝ අනතුරුදායක තත්වයක් මත කටයුතු කිරීම ( ලකුණු 03 )

(ආ) පහත දී ඇති එක් එක් යුගල පද සැකසී ඇති රටාව දක්වන්න.

| | | |
|---|---|---|
| 1. උදවු - උපකාර | 2. පින් - පව් | 3. කර - කබල් |
| 4. අප්පු - තිප්පු | 5. අතු - පතු | 6. කා - බී |

( ලකුණු 03 )

(ඉ) පහත දැක්වෙන ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අර්ථ දක්වන්න

1. හිරය 2. හින්නා 3. රැකුල 4. විලක්කු 5. බක්කා 6. රසබෝය

( ලකුණු 03 )

(ඊ) පහත දැක්වෙන රූඪිවල අදහස ඔප්නැංවෙන සේ වාක්‍යවල යොදන්න.

| | | |
|---|---|---|
| 1. අකුල් හෙළනවා | 2. ඇඹලයා | 3. කප්පිත්තා |
| 4. කෝපි කාලෙ | 5. තිප්පොළ | 6. වහ කදුරු |

( ලකුණු 03 )

08. පහත සඳහන් ඡේදය සම්බන්ධයෙන් පහතින් දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ග්‍රන්ථපරිශීලනයේදීහොඳනරකවාසිඅවාසිපිළිබඳවපමණක්නොවඒවායින්හෙළිවනවිදේශසම්බන්ධවිස්තරභෞතිකඅභෞතිකවිස්තරඓතිහාසිකවීරකතාජනකතාමනඃකල්පිතකතායනාදියපිළිබඳවවිමසීමදඋචිතයනිර්මාණාත්මකසිත්ගන්නාශෛලියකින්ඉදිරිපත්වීඇතිකවිගීතනාටකාදියමෙන්මජීවිතසිද්ධිපරිසරවිශේෂතාප්‍රියමනාපඅයුරින්ඉදිරිපත්වඇතිකතාබොහෝදුරටපාඨකඅවධානයවහායොමුකරගැනීමටසමත්වෙයි.සෙංකොට්ටන්නවතකාවේවැනිභාෂාශෛලියකින්රචනාවීඇතිනම්එයදපාඨකඅවධානයවහවහායොමුකරගැනීමටහේතුවනුඇත.

1. ඉහත ඡේදය වඩාත් ම ශාස්ත්‍රීය ක්‍රමයකට අනුව පද බෙදා උචිත විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.
2. **විසර්ගය සහ රකාරාංශය** යෙදුණු පදය බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.
3. **පාඨක අවධානය** යන්න සංධි කර දක්වන්න
4. **'ශෛලියකින්'** යන පදයේ පිල්ලම් නම් කරන්න.
5. ඔබ දන්නා ගැටපිල්ල සහ ඉස්පිල්ල යෙදුණු පද දෙකක් ලියන්න. ( ලකුණු 7 + 8 = 15 )

# තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018 - සිංහල I

## පිළිතුරු පත්‍රය

## I කොටස

01. (අ) (i) සුඹුළු / පොතු
(ii) වරදවා පිළියම් කිරීම / වැදි ප්‍රතිකාර කිරීම / නිදන් බලා පිළියම් නොකිරීම.
(iii) අසාධ්‍ය අවස්ථාවේ / පිළියම් කළ නොහැකි අවස්ථාවේ
(iv) පය බරවායට පිටිකර බෙහෙත් බඳිනා සේ
ඇස් සරහන්නට තොල අඳුන් ගානා සේ
ආඟා යවා තබාලා වල්පත ගන්නා සේ
(v) නියම / ස්ථිර, වරල / වලිගය (ලකුණු 4යි)

(ආ) (i) විශේෂණ සමාසය (ii) හඳුන්, සඳුන් දෙව්දුරු තුවරලා
(iii) කිඳුරා / බෝධි සත්වයෝ, කිඳුරංගනාව (iv) උපමාව - මිණි කිරුළු අගක්මෙන්
උපමේය - පෘථිවිය නැමති අංගනාව (ලකුණු 4යි)
(v) ගෙඩි/ දළු, මහාවනය / පෞරාණික වනය / මුල්වනය

(ඉ) (i) ස්වර්ණතිලකා
(ii) තමාගේ කුලයේ අයගෙන් / තමාගේ ජාතියේ අයගෙන්
(iii) පක්ෂීන්ගෙන් හීනවූ කපුටුධෙනුවක් තෙමෝ කවර කලෙක ස්වර්ණහංසරාජයකු හා සමඟ කෙසේ නම් සමාගම වේද
(iv) අඩු කුලවතුන් / කුලයෙන් උසස් (ලකුණු 4යි)

(ඊ) (i) රන්මිණි සළඹ
(ii) බඹසර සිත
(iii) සුරංගනාවන්ගේ රංගනය පරද්දවමින්
(iv) දිව්‍යාංගනාවන්, පුරාංගනාවන් (ලකුණු 4යි)

(උ) (i) බුද්ධ පුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියේ අනුරුද්ධ කුමාර කථාවස්තුවේ අනුරුද්ධ කුමරයා විසින් මහන වීමට එන ලෙස භද්දිය රජුන්ට ආරාධනා කළ අවස්ථාවේ භද්දිය රජු විසින් අනුරුද්ධ කුමරුට ප්‍රකාශ කරන ලද්දකි.
(ii) පන්සිය පනස් ජාතක කථාපොතේ චන්ද කින්නර ජාතක කථාවේ කිඳුරා විසින් කිඳුරියට, බරණැස් රජුගේ හී පහර ලැබ වේදනාවෙන් පසු වූ අවස්ථාවේදී
(iii) දෙවෙනි ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ ස්වර්ණතිලකා කථා වස්තුවේ උද්දාල බමුණා විසින් මිතුරන්ට ප්‍රකාශ කරන ලදි. ස්වර්ණතිලකා දැක ඇයගේ රූපශ්‍රීය පිළිබඳ මිතුරන් සමඟ ප්‍රකාශකළ අවස්ථාවේදී
(iv) කේ ජයතිලක මහතා විසින් රචිත නොනිමි සිත්තම කෙටි කතාවේ ශිලා විසින් අගාතට, අසංගගෙ නෝනා ඊයේ රූපවාහිනියෙ සිටි බව ශීලා ප්‍රකාශ කළ අවස්ථාවේදී
(v) ඒ.පී. ගුණරත්න මයා විසින් අනුවාදය කරන ලද බැද්දේගම නවකතාවේ කර්ලිනා විසින් පුංචි රාළට, බෙහෙත් හා යන්ත්‍ර මන්ත්‍ර පිළිබඳ පුංචිරාළ කර්ලිනාන් සමඟ කථාබහ කළ අවස්ථාවේදී
(vi) එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත පෙමතො ජායතී සොකො නාට්‍යයෙහි උද්ධාල බමුණා විසින් සිසුන්ට, දප්පුල සිසු සැඩොල් බමුණා හා එම දියණිය අසපුවෙන් පිටමං කළ අවස්ථාවේදී

(ඌ)ලකුණු 16 යි.
කාව්‍ය රසාස්වාදයට යෝග්‍ය වන සංකේත, ව්‍යංගාර්ථ, වර්ණනා, ආකෘතිය හා වස්තු විෂය පිළිබඳ අදහස් දක්වා තිබීම අවශ්‍යවේ.

* ප්‍රශ්න අංක 02 සිට 08 දක්වා ප්‍රශ්න වලට සපයා ඇති පිළිතුරුවල අදාළත්වය ප්‍රමාණාත්මක හා විචාරාත්මක බව සලකා ලකුණු ලබාදෙන්න.

# සිංහල II

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | 1 - 3 | 2 - 5 | 3 - 1 | 4 - 4 | 5 - 2 |
| | 6 - 2 | 7 - 1 | 8 - 4 | 9 - 5 | 10 - 3 |
| | 11 - 5 | 12 - 3 | 13 -1 | 14 -2 | 15 -4 |
| | 16 - 1 | 17 - 5 | 18 - 5 | 19 -2 | 20 -3 |

2. අ) 1. ක්‍රිස්තු වර්ෂයට පෙර දෙවන තුන් වන ශත වර්ෂවල 2. නොඑක් තරාතිරමේ අය
3. සීගිරියේ වූ රූප/ බිතු සිතුවම් 4. ගලෙහි වූ ඉඩ සීමිත වීම.
5. සීගිරි ගීත පිළිබඳව විවරණය කිරීම

ආ) සාරාංශය-) සාරාංශය එක් ඡේදයක් විය යුතු ය. ඡේද බෙදා ඇත්නම් ලකුණු අඩු වේ. වචන සංඛ්‍යාව 55 - 65ත් අතර විය යුතු ය.

( ලකුණු බෙදී යන පිළිවෙළ -)
අන්තර්ගත කරුණු ලකුණු - 08යි අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ - 04යි
ශිල්පීය දක්ෂතා ( පද බෙදීම, විරාම ලක්ෂණ ආදියට ලකුණු - 03යි)
ඡේද බෙදා ඇත්නම් ලකුණක් අඩු කරන්න ( 8 + 4 + 3 = 15)

3. වාක්‍ය රචනයට අවධානය යොමු කිරීමේ දී පහත කරුණු කෙරහි අවධානය යොමු කිරීම සුදුසු ය.

1 මාතෘකාව යටතේ ප්‍රමාණවත් කරුණු ඒකරාශී කර තිබීම.
2 කරුණුවල සංවිධානාත්මක බව.
3 කරුණුවල පැහැදිලි බව.
4 නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිතය.
5 ව්‍යාකරණ දොස් රහිත බව.
6 ව්‍යක්ත ලෙස බස හැසිරවීම.
7 සුදුසු පරිදි ඡේද වෙන් කිරීම.
8 උපමා, රූපක, පිරුළු වැනි උචිත සාම්ප්‍රදායික භාෂාංග භාවිතය.
9 නියමිත වචන සංඛ්‍යාව 50කට වඩා අඩු හෝ වැඩි වීම.

4 (අ) 1 **කිසිවක්** මෙසේ කීවා ය. 2. කාන්තා **තුමූ** මිහිරි ගී ගයත්.
**3 (නිවැරදිය)** සමන් මල් සුවඳ ය. 4. ඉඩම් හිමියෝ **සේවකයන්** ලවා බිම් සකසවති.
5. ඔවුහු හෝ අපි හෝ නගරයට **යමු.**

(ආ)

1 කුරුලු මව විසින් දරුවෝ රැකුණු, රක්නා ලදහ/ලැබූහ, ලද්දෝය, රකිනු ලැබුවෝ ය.
2 වැඩිමහල් සොහොයුරා විසින් අසරණත්වයට පත් ඕ රැකෙයි, රකිනු ලබයි/ලැබෙයි.
3 ඔහු විසින් වැඩ කෙරෙයි,වැඩ කරනු ලබයි/ලැබෙයි.
4 ජයරත්න විසින් නයා ද මුගටියා ද මැරෙති, මැරෙත්, මරනු ලබති/ලැබෙති.
5 වසන්ත විසින් මල් කඩනු ලබයි/ලැබෙයි/කැඩෙයි.

(ඉ)
1 ( මිනිස්සු ) සේවා ස්ථානයට යත්.
2 සභා ( තුමූ ) සතුටින් විසිර ගියහ.
3 මැණියන් දෑ ( දරුවන් ) යහමග යැවූහ.
4 ( ඕ ) මහන්සි වී වැඩ කර ජීවිතය ජය ගත්තා ය.
5 වරදට හසු නොවීමට ( ඔවුන් ) කීවේ අසත්‍ය ය.

05. (අ) 1. දීර්ඝ කාලයක් පවතින 2. මුහුණට වැටෙන සේ ගෙතු කෙස් රොද 3. සහමුලින් ම විනාශ කිරීම

(ආ)1. ආක්‍රමණය 2. ආරෝහ පරිනාහ 3 කංචුකය/සන්නාහය
(ඉ)1. අතරෙහි 2. පල 3 පොළ 4 ශාරීරික 5 මානසික 6 වියන

(ඊ) 1. (ජලය) - සඳ, අමාවක, දිවබොජුන්, නිවන

2. (කාලය) - ස්ත්‍රිය, කාන්ත, කලහය, කමත
3. (උත්සාහ/වීර්ය) - ශරීරය, වෛරය, බර දෙය
4. (සමාන/තරම්) - හාවා, බඩගින්න,ආවා,ශාඛා,සාගත
5. (සත්වයා) - සියය,ඇත්ත,ආයුධය,කුඩය,හ
6. (චන්ද්‍රයා) - සන්ධ්‍යාව,කල්හි,සනධි,ඡන්දස්,ඡන්දය,සැකය

06. ගුරුතුමා - සංධි - පරස්වර ලෝප
නිපාත - උන්හ - ක්‍රියා - අවසාන ක්‍රියා

අවධි කර - කියා - පූර්ව ක්‍රියා
වෙත්වායි - ක්‍රියා - ප්‍රාර්ථනා ක්‍රියා

භක්තිමත් - තද්ධිත - අස්ත්‍යාර්ථයේ තද්ධිත
විවාදයට - උපසර්ග - අර්ථ තීව්‍ර කිරීමේ උපසර්ග

සැදූහැතියෝ - විභක්ති - ප්‍රථමා විභක්ති
තෙල්මල්පහන් - සමාස - දකාරාර්ථ සමාස

යනෙන - සංධි - ස්වරාදේශ සංධිය
රැකදේවා - ක්‍රියා - ප්‍රාර්ථනා ක්‍රියා

සඳහා - නිපාත - පිණිසාර්ථයේ

ගුණවත් - තද්ධිත - අස්ත්‍යාර්ථයේ තද්ධිත

ගැමියා - සංධි - ගාත්‍රාදේශ සංධිය

නැගිට - ක්‍රියා -පූර්ව ක්‍රියා

දෙවිදුන් - විභක්ති- කර්තෘ විභක්ති

07. (අ) 1. පල නොකියා පළා බෙදීම
2. කතාව දෝලාවෙන් ගමන පයින්
3. වත්ත බද්දට දී ඇස්සට දත නියවීම
4. ඉසේ රුදාවට කොට්ටය මාරු කිරීම/ අතීසාරෙට අමුඩෙ ගැසීම
5. කොහොඹ ගහට කරවිල වැල ගියා වගේ
6. දත් තිස් දෙක මැද තිබෙන දිව වගේ

(ආ) 1. සමානාර්ථ යුගල පද 2. විරුද්ධාර්ථ යුගල පද 3. විවිධාර්ථ දනවන යුගල පද
4. අනුකරනාත්මක ශබ්ද රටා සහිත යුගල පද
5. පළමු පදයේ අර්ථ ඇති දෙවන පදයේ අර්ථ නැති යුගල පද
6. පූර්ව ක්‍රියා දෙකකින් සැකසුණු යුගල පද

(ඉ) 1. විවාහය 2. කුඹියා 3. කැලය/වනය 4. පන්දම් 5. ලොකු අයියා 6. හකුරු

(ඊ) 1. බාධා කරනවා 2. යම් දෙයකට ගිජුව සිටින්නා 3. යම් දෙයකට දක්ෂයා
4. පැරණි කාලෙ 5. නිතර ගැවසෙන තැන 6. ඉතා අප්‍රිය

08 1 ග්‍රන්ථ පරිශීලනයේ දී හොඳ - නරක, වාසි - අවාසි පිළිබඳව පමණක් නො ව, ඒවායින් හෙළිවන විදේශ සම්බන්ධ විස්තර, භෞතික - අභෞතික විස්තර, ඓතිහාසික/ වීර කතා, ජනකතා, මනඃකල්පිත කතා යනාදිය පිළිබඳව විමසීම ද උචිත ය. නිර්මාණාත්මක, සිත් ගන්නා ශෛලියකින් ඉදිරිපත්වී ඇති කවි,ගීත, නාටකාදිය මෙන් ම ජීවිත සිද්ධි, පරිසර විශේෂතා ප්‍රියමනාප අයුරින් ඉදිරිපත් ව ඇති කතා බොහෝ දුරට පාඨක අවධානය වහා යොමුකර ගැනීමට සමත් වෙයි. " සෙංකොට්ටන් " නවතකාවේ වැනි භාෂා ශෛලියකින් රචනා වී ඇති නම් එය ද පාඨක අවධානය වහ වහා යොමුකර ගැනීමට හේතු වනු ඇත.

1 ප්‍රියමනාප, මනඃකල්පිත
2 පාඨකාවධානය
3 කොම්බුදෙක, ඉස්පිල්ල, ඉස්පිල්ල, හල්කිරීම.
4 නිරවද්‍යතාවය මත ලකුණු පිරිනමන්න.